ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

ප්‍රසම්පාදන දැන්වීමයි

කොරියානු ජනරජය වෙත පිටත්ව යන ධීවර අංශයේ සේවකයින් සඳහා විශේෂිත පුහුණුවක් ලබාදීම පිණිස පිළිගත් ආයතන වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවීමයි

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) විසින් කොරියානු ජනරජයේ ධීවර අංශයේ රැකියා සඳහා තෝරා ගන්නා ලද සේවකයින් වෙත විශේෂිත පුහුණු සේවාවන් සැපයීම සඳහා පිළිගත් ආයතනවලින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

ලංසු ඉදිරිපත් කරන ආයතනයෙන් ලැබෙන ලිඛිත ඉල්ලීමක් සමඟින්, ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තුවක් වන රු. 5,000/- ක මුදලක් ගෙවීමෙන් අනතුරුව, 2026.10.26 දින සිට 2026.11.16 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන් ලංසු ලේඛන ලබාගත හැක.

අවශ්‍යතා:

- පුහුණු පාඨමාලාවේ කාලය - දින 07 කි (මුහුදු යාත්‍රා තුළ - නේවාසිකව)
- සෑම කණ්ඩායමකම පුහුණුවන්නන් සංඛ්‍යාව - උපරිම පුද්ගලයින් 50 කි

පුහුණුව මඟින් පහත සඳහන් මාතෘකා ආවරණය කළ යුතුය:

ප්‍රායෝගික පුහුණුව:

මුහුදේ සංඥ, පද්ධතිය, කම්බි උපකරණ හැසිරවීම, කම්බි දැල් උපකරණ හැසිරවීම, ගැට ගැසීම සහ වෙල්ඩින් කිරීම (Tie and welders), යාත්‍රාව තුළ හැසිරීම, යාත්‍රාවේ විදුලි උපකරණ සහ මුහුදේ සලකුණු හඳුනා ගැනීම, යාත්‍රාවේ දෙපැත්ත සහ කොටස් හඳුනා ගැනීම, දැල් අලුත්වැඩියා කිරීම (Net Mending), විවිධ ධීවර ක්‍රම (ප්‍රායෝගික), ධීවර වර්ග හඳුනා ගැනීම, සැකසීම සහ හැසිරවීම, ජීවිතාරක්ෂක - ප්‍රායෝගික පුහුණුව

න්‍යායාත්මක පුහුණුව:

මාළු වර්ග වර්ගීකරණය කිරීම, මිරිදිය සහ දැඩි ජල මසුන් හඳුනා ගැනීම, මත්ස්‍ය වගා ක්‍රම, ධීවර ක්‍රම, විවිධ උපකරණ හැසිරවීම මඟින් සිදු කරන ධීවර ක්‍රම, මාළු කල් තබා ගැනීමේ ක්‍රම, මසුන් ඇල්ලීම සඳහා භාවිතා කරන උපකරණ, නාවික හමුදු සහ සංචාලනය (Seaman Ship & Navigation), ජීවිතාරක්ෂක (ආරක්ෂාව)

වෙනත් අවශ්‍යතා (Other Requirements):

1. පුහුණුකරු විසින් සෑම පුහුණුලාභියෙකුටම ජීවිත රක්ෂණයක් ලබා දිය යුතුය.
2. මුහුදු ප්‍රදේශයේදී සියලුම පුහුණුලාභීන්ට අවශ්‍ය උපදෙස් සහිත ජීවිතාරක්ෂක කබා (Life jackets) ලබා දිය යුතුය.
3. ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 20 ක පළපුරුද්දක් ඇති සුදුසුකම්ලත් ධීවර අංශයේ ප්‍රධාන පුහුණුකරුවෙකු සහ එම ක්ෂේත්‍රයේම වසර 15 ක පළපුරුද්දක් ඇති සහය පුහුණුකරුවෙකු මෙන්ම ප්‍රායෝගික කටයුතු සඳහා අවශ්‍ය ධීවර උපකරණ සැපයිය යුතුය.
4. අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් සහිතව පුහුණුලාභීන් සඳහා නේවාසික පහසුකම් ලබා දිය යුතුය.
5. පුහුණුව අතරතුර උදෑසන තේ, ප්‍රධාන වේල් තුන සහ අනෙකුත් පාන වර්ග නියමිත පරිදි සැපයිය යුතුය.
6. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ධීවර අංශයේ පුහුණු ආයතනයක් ලෙස වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.

ලංසුව අඩංගු කවරයේ මුදුනෙහි "කොරියානු ජනරජය වෙත පිටත්ව යන ධීවර අංශයේ සේවකයින් සඳහා විශේෂිත පුහුණුව" (Specialized Training for Fishery sector Workers Leaving for Republic of Korea) ලෙස සටහන් කර, 2026.11.17 දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයේ ඒ සඳහාම සකස් කර ඇති ලංසු පෙට්ටියට බැහැර කළ යුතුය.

ලංසු භාර ගැනීම 2026.11.17 දින පෙ.ව. 11.00 ට අවසන් වන අතර, අවසන් වීමෙන් පසු වහාම ලංසුකරු හෝ ලංසුකරුගේ නියෝජිතයින් ඉදිරියේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයේදී ලංසු විවෘත කරනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා, අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රසම්පාදන කළමනාකරු අමතන්න.

කිසිදු හේතුවක් සඳහන් නොකර ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ඕනෑම ලංසු ලේඛනයක් සකස් කිරීම හෝ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව දරනු ලබන කිසිදු වියදමක් ආපසු ගෙවීමට බැඳී නොසිටියි. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

සභාපති
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.
දුරකථන අංක: 0112864101-105 / 0112887585
වෙබ් අඩවිය: www.slbfe.lk